**ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන සේවයේ පළාත් අධ්‍යක්ෂ තනතුර සඳහා අදාල වන ලකුණු ලබාදීමේ පටිපාටිය**

| ලකුණු ලබා දෙනු ලබන ක්ෂේත්‍රයන් | උපරිම ලකුණු ප්‍රමාණය | ලකුණු |
|---|---|---|
| ජ්‍යොෂ්ඨතාවය ලකුණු 40 | 1 වන ශ්‍රේණියේ වසර 05ක සක්‍රීය සේවා කාලය ඉක්මවා ඇති වැඩිම අමතර සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරියාට ජ්‍යොෂ්ඨතාවයට හිමි ඉහළම ලකුණු ප්‍රමාණය ලබා දෙන අතර සෙසු නිලධාරීන්ට පහත ආකාරයට ලකුණු ලබා දෙනු ලැබේ.<br><br>ජ්‍යොෂ්ඨතාවය සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු<br>______________________<br>වැඩිම අමතර සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරියාගේ එකී සේවා කාලය (අවුරුදු X 12 + මාස)<br><br>* අදාළ නිලධාරියාගේ අමතර සක්‍රීය හා සතුටුදායක සේවා කාලය (අවුරුදු X 12 + මාස) | 40 |
| කුසලතාවය ලකුණු 60 | **2.1 ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I ශ්‍රේණියේ තනතුරක සේවා කාලය සඳහා** - උපරිම ලකුණු 10<br><br>I ශ්‍රේණියේ තනතුරක සේවා කාලය සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු<br>______________________<br>I ශ්‍රේණියේ තනතුරක වැඩිම සේවා කාලයක් සහිත නිලධාරියාගේ එකී සේවා කාලය (අවුරුදු X 12 + මාස)<br><br>* අදාළ නිලධාරියාගේ I ශ්‍රේණියේ තනතුරක සේවා කාලය (අවුරුදු X 12 + මාස) | 10 |
| | **2.2 වෘත්තීය ක්‍රියාකාරකම් (ඉදිරිපත් කිරීම)** - උපරිම ලකුණු 20<br>• අන්තර්ගතය තුළ ක්ෂේත්‍රයේ උන්නතියට වන දායකත්වය - ලකුණු 08<br>• පරීක්ෂණ මණ්ඩලය යොමු කරන ගැටළු සඳහා දක්වන ප්‍රතිචාර - ලකුණු 05<br>• ඉදිරිපත් කිරීමේ විලාශය හා කාල කළමණාකරණය - ලකුණු 04<br>• සැකසුම, නිර්මාණය - ලකුණු 03<br><br>( නිලධාරියා විසින් පශු සම්පත් ක්ෂේත්‍රයේ උන්නතියට ඉටු කරන ලද රාජකාරි කටයුතු සම්බන්ධයෙන් පරිගණක ආශ්‍රයෙන් කරනු ලබන විනාඩි 10ක ඉදිරිපත් කිරීමක් වේ. එය අදාළ කාලසීමාවට සරිලන ලෙස ස්ව අභිමතය පරිදි තෝරාගත හැකිය. නිලධාරියා විසින් ඉටු කරන ලද රාජකාරි බවට සනාථ කිරීම සඳහා වන ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතුය.) | 20 |
| | **2.3 වෙනත් සුදුසුකම්** - උපරිම ලකුණු 25<br>• පළාත්,ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ලබාගෙන ඇති සුවිශේෂී ජයග්‍රහණ හෝ<br>• අදාළ ක්ෂේත්‍රය වෙනුවෙන් සිදු කරන ලද සුවිශේෂී දායකත්වයන් සම්බන්ධයෙන් වන ප්‍රශංසා ලිපි (පොදු 230 බී ආකෘතියෙන්) හෝ<br>• අන්තර්ජාතික හෝ ජාතික වැදගත්කමකින් යුතු ප්‍රකාශන හෝ<br>• අන්තර්ජාතික හෝ ජාතික විද්‍යාත්මක සඟරාවල පළ කරන ලද පත්‍රිකා<br><br>(මෙහිදී නිලධාරියාගේ ඍජු දායකත්වය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සනාථ කළයුතු අතර ලේඛන ලකුණු 05 බැගින් උපරිම අවස්ථා 05ක් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.ප්‍රශංසා ලිපි අයදුම්පත් කැඳවීමේ දිනට පෙර දිනයක නිකුත් කරන ලද්දක් විය යුතුය.) | 25 |

| | | |
|---|---|---|
| | **2.4 සම්මුඛ පරීක්ෂණයේදී දක්වන නිපුණතාවය** - උපරිම ලකුණු 05<br>සන්නිවේදන කුසලතාවය සඳහා - ලකුණු 02<br>නායකත්වය සඳහා - ලකුණු 02<br>පෞරුෂත්වය සඳහා - ලකුණු 01 | 05 |
| මුළු ලකුණු | | 100 |